## ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව - 2016

-----------------------------------------------------------------------

ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ හා එහි පරිපාලිත සමාගමේ 2016 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, ඒකාබද්ධ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2006 අංක 35 දරන ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත 1968 අංක 15 දරන ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධන මණ්ඩල පනතේ 17 (1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිති වලට (ISSAI 1000 - 1800) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන් , වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරි බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 අහිතකර මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 හා 2.3 ඡේදවල දක්වා ඇති කරුණුවලට ගැලපීම් කර තිබුණේනම් අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බොහොමයක් මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 අහිතකර මතය - සමූහය

මෙම වාර්තාවේ 2.2 හා 2.3 ඡේදවල දක්වා ඇති කරුණුවල වැදගත්බව හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ සහ එහි පරිපාලිත සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### අහිතකර මතය - සංස්ථාව

මෙම වාර්තාවේ 2.3 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්බව හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම - සමූහය

සමාලෝචිත වර්ෂය සඳහා වූ සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන එහි පරිපාලිතය වූ සීමාසහිත ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ ( පුද්ගලික) සමාගමේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සමඟ ඒකාබද්ධ කර තිබුණද පරිපාලිත සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී එහි උප පරිපාලිත සමාගමක් වන එල් ආර් ඩී සී සේවා (පුද්ගලික) සමාගමේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඒකාබද්ධ කර නොතිබුණි. පරිපාලිත සමාගම සම්බන්ධයෙන් සංස්ථාවේ හිමිකාරිත්වය සියයට 80 ක් නියෝජනය විය.

පහත සඳහන් නිරීක්ෂණයන් පදනම් කරගෙන සීමාසහිත ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ (පුද්ගලික) සමාගමේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතය ව්‍යාචනය කර තිබුණි.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. මිලියන 212.24 ක ශේෂයන්ට අදාල ලිඛිත සාක්ෂි නොමැති වීම හේතුවෙන් එම ශේෂයන්ගේ පැවැත්ම, සම්පූර්ණත්වය හා නිවැරදි බව තහවුරු කර ගැනීමට නොහැකි වීම.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.මිලියන 35.05 ක ගෙවිය යුතු හා ලැබිය යුතු ශේෂයන් පිළිබඳ නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා ශේෂ සනාථ කිරීම් සපයා නොතිබීම.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 11 ට පටහැනිව කොන්ත්‍රාත් ආදායම මුදල් පදනම මත ගිණුම් ගත කිරීම.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පොත් අගය ( Net Book Value) රු.මිලියන 3.15 ක් වූ සිමෙන්ති බ්ලොක් මැෂින් එකක් වෙනුවෙන් හානිකරණය (Impairment) ගණනය නොකිරීම.

## 2.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම - සංස්ථාව

### 2.3.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත දැක්වෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

**(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01**

(i) ප්‍රමිතය ප්‍රකාරව විස්තීරණ ආදායම් ප්‍රකාශනය තුල කාලපරිච්ඡේදයට අදාල වෙනත් විස්තීරණ ආදායම් ගැලපීම් හා එයට අදාල හෙළිදරව් කිරීම් කල යුතු වුවත්, සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂයට අදාලව පිළියෙල කරන ලද විස්තීරණ ආදායම් ප්‍රකාශනයෙහි වෙනත් විස්තීරණ ආදායම් ගැලපීම් හෝ එයට අදාල හෙළිදරව් කිරීම් කර නොතිබුණි.

(ii) මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් වත්කම්, වගකීම්, ආදායම්, වියදම් සාධාරණ අගය (Fair Value) මත ඉදිරිපත් කල යුතු වුවද සංස්ථාව විසින් පිරිවැය රු.මිලියන 1,288.15 ක දේපල පිරියත උපකරණ වල සාධාරණ අගය තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය තුලදී සංස්ථාව විසින් රු. මිලියන 163.87 ක තැන්පතු බැංකු ඇපකර වශයෙන් තබා තිබුණද, මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර තිබුණු ඇප වශයෙන් තබන ලද ස්ථාවර තැන්පතු වල වටිනාකම රු. මිලියන 100 ක් පමණක් විය. එමෙන්ම ඇපකර වලට අදාල ශේෂ සනාථ කිරීම්ද විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 11**

(i) සංස්ථාව විසින් සිදු කරමින් පවතින ඉදිකිරීම් (Ongoing Construction) කොන්ත්‍රාත් වල ආදායම, පිරිවැය හා ලාභය නිමවුම් ප්‍රතිශත ක්‍රමය (Stage of Completion) මත හඳුනාගන්නා බව මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කර තිබුණද කොන්ත්‍රාත් ආදායම, පිරිවැය හා ලාභය ප්‍රමිතයෙහි සඳහන් නියමයන්ට අනුව හඳුනාගෙන නොතිබුණි. සහතික කළ වැඩ සඳහා වැයකරන ලද පිරිවැය, අදාල ආදායම හා වියදම සමඟ ගැලපීමට හැකිවන පරිදි හඳුනාගෙන නොතිබීම නිසා ඒකාකාරී පදනමකින් ආදායම හඳුනාගැනීමට නොහැකි වී තිබුණි. එම නිසා සමාලෝචිත වර්ෂයේ ඉදිකිරීම් කොන්ත්‍රාත් 21 ක් සඳහා හඳුනාගෙන තිබුණු ලාභය විශාල වශයෙන් උච්චාවචනය වී තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව නොනිමි වැඩ රු.මිලියන 728.85 ක් වූ ඉදිකිරීම් කොන්ත්‍රාත්තු 13 ක නොනිමි වැඩ වල නිමවුම් ප්‍රතිශත හා හඳුනාගත් ආදායම් පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කර නොතිබුණි.

**(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 20**

ප්‍රමිතයේ 39 සී වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසානයට සංස්ථාව වෙත ලැබී තිබුණු රු.මිලියන 778.41 ක රජයේ ප්‍රදාන සම්බන්ධයෙන් ඉටු නොවූ කොන්දේසි හා අසම්භාව්‍යයන් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

**(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 37**

සමාලෝචිත වර්ෂය අවසානයට ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් සංස්ථාවට එරෙහිව බාහිර පාර්ශව විසින් ගොනුකල නඩු 17 ක් වෙනුවෙන් ඇතිවිය හැකි රු.මිලියන 296.96 ක අසම්භාව්‍ය වගකීම ගණනය කර ප්‍රමිතිය ප්‍රකාරව ප්‍රතිපාදනයන් සිදුකර නොතිබුණි.

**(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 38**

ප්‍රමිතයේ 118 ඡේදය ප්‍රකාරව සංස්ථාව සතු පරිගණක මෘදුකාංග වෙනමම හඳුනාගෙන නොතිබුණු අතර ඒ සම්බන්ධව ප්‍රමිතය ප්‍රකාරව ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශනවල සිදුකර නොතිබුණි.

**(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39**

ප්‍රමිතය ප්‍රකාරව සංස්ථාවේ මූල්‍ය වත්කම් (Financial Assets) වර්ගීකරණය කර නොතිබුණි. එසේම මූල්‍ය වත්කම් ලෙස හඳුනාගත යුතු වෙළඳ ණයගැතියන්ගේ හානිකරණය වූ අගය අරමුණුගත සාක්ෂි (Objective Evidence) මත හඳුනාගෙන යථාර්තවාදී අගයක් මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කිරීම වෙනුවට වසරක් ඉක්මවූ සියළුම ණය ගැතියන් සඳහා සියයට 100 ක බොල්ණය ප්‍රතිපාදනයක් සිදු කර තිබුණි.

**(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 40**

(i) මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් රු.මිලියන 745.57 ක ආයෝජන දේපල වලට අදාල ගිණුම් ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණු අතර එම දේපල වල සාධාරණ අගය ගණනය කර මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි. එමෙන්ම සංස්ථාව කුලී පදනම මත බාහිර පාර්ශවයන් වෙත ලබා දී තිබුණු ඉඩම්, ආයෝජිත දේපළ ලෙස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබූ අතර එම ඉඩම්වල වටිනාකම පිළිබඳ තොරතුරුද විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ii) සමාලෝචිත වර්ෂය අවසානයට සංස්ථාව විසින් දිගු කාලීනව බදු දී ඇති රු.මිලියන 17.58 ක වටිනාකම ඇති ඉඩම් 07 ක් ආයෝජන වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

**2.3.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මහ කොළඹ නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ඉකුත් වර්ෂයේදී සංස්ථාවට ලැබී තිබුණු යන්ත්‍ර 03 හි වටිනාකම සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි.

(ආ) වැඩ සම්පූර්ණ කළ ව්‍යාපෘති වලින් ගොඩනගන ලද වත්කම්, අදාල වත්කම් වලට එකතු කරනු වෙනුවට එම වත්කම් සඳහා වැය කර තිබුණු රු. මිලියන 716.50 ක් වෙනත් ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි.

(ඇ) ජංගම නොවන වත්කම් යටතේ දැක්විය යුතු ව්‍යාපෘති නොනිමි වැඩ රු.මිලියන 728.85 ක් වෙළඳ තොගය යටතේ දක්වා තිබුණි. එම නිසා ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් අධිගණනය වී තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව විසින් භාණ්ඩාගාර ප්‍රදාන යටතේ ඉටුකරන ලද ව්‍යාපෘති වෙනුවෙන් භාණ්ඩාගාරයෙන් රු.මිලියන 2,296.80 ක් ලැබිය යුතු වුවද මූල්‍ය ප්‍රකාශන තුල එම වටිනාකම රු.මිලියන 1,626.27 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් සංස්ථාව විසින් භාණ්ඩාගාර ප්‍රදාන මත අයකරනු ලැබූ සේවා ගාස්තු ආදායම රු.මිලියන 670.53 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසානයට වේරස් ගඟ ව්‍යාපෘතිය යටතේ ලබාගත් ණය මුදලේ වාරික හා පොලී, සංස්ථාව විසින් නියමිත දිනයන්හි ගෙවීමට කටයුතු නොකිරීම හේතුවෙන් බැංකුව ගණනය කළ දඩ පොලිය වූ රු.මිලියන 4.25 ක් මූල්‍ය ප්‍රකාශන වල ගෙවිය යුතු ලෙස දක්වා නොතිබුණි.

(උ) මූල්‍ය ප්‍රකාශන තුල විලම්භිත ආදායමක් (Differed Income) ලෙස පෙන්විය යුතු වේරස්ගඟ ව්‍යාපෘතිය වෙනුවෙන් දරන ලද හා මහා භාණ්ඩාගාරයෙන් අය විය යුතු වටිනාකම වූ රු.මිලියන 3,332.94 ක් සංස්ථාවේ ආදායමක් ලෙස දැක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ ආදායම එම වටිනාකමින්ම අධිගණනය වී තිබුණි.

(ඌ) සංස්ථාවේ වැලි තොග ලේඛනය අනුව විකුණන ලද මුහුදු වැලි කියුබ් ගණන 117,782 ක් වුවද වැලි විකුණුම් ලේඛනය අනුව එය කියුබ් 118,614 ක් විය. එම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ වැලි විකුණුම් ආදායම කියුබ් 832 කින් එනම් රු.මිලියන 6.74 කින් අධිගණනය වී තිබුණි.

(එ) සංස්ථාව විසින් ක්‍රියාත්මක කරන මීහිජය කොම්පෝස්ට් ව්‍යාපෘතියේ සමාලෝචිත වර්ෂයේ වියදම ලෙස මූල්‍ය ප්‍රකාශන තුල රු.139,378 දක්වා තිබුණද වියදම තුල ව්‍යාපෘතියට අදාල පොදුකාර්ය වියදම් ඇතුලත් කර නොතිබීම හේතුවෙන් ව්‍යාපෘති ලාභය අධිගණනය වී තිබුණි.

(ඒ) 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් බදු කුලිය වාර්ෂිකව සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණු අතර 2005 වර්ෂයේ සිටම බදුකරු සමග නීත්‍යානුකූල බදු ගිවිසුමකටද එළඹ නොතිබුණි. තවද සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයට අයිති පර්චස් 5.77 ක ඉඩමක් 2005 ජුලි 01 දින කල්බදු පදනම මත පෞද්ගලික සමාගමක් වෙත ලබා දී තිබුණද 2014 ජුලි මාසයේ සිට ඊට අදාල ආදායම ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඔ) වේරස්ගඟ වැසි ජල අපවහන හා පරිසර වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ බලපෑමට ලක්වන පුද්ගලයින් සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වන විට සංස්ථාව විසින් ගෙවා තිබූ රු.මිලියන 73.51 ක්වූ අත්තිකාරම්, මූල්‍ය ප්‍රකාශනවල අත්තිකාරම් ලෙස දැක්වීම වෙනුවට විවිධ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ ජංගම වත්කම් එම වටිනාකමින්ම ඌන ගණනය වී තිබුණු අතර වර්ෂයේ වියදම එම වටිනාකමින්ම අධිගණනය වී තිබුණි.

**2.3.3 පැහැදිලි නොකල වෙනස්කම්**

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවේ පරිපාලිත සමාගමක් වන ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ පුද්ගලික සමාගමෙන් සංස්ථාවට ලැබිය යුතු ලෙස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන වල රු. 35,083,245 ක් දක්වා තිබුණද සමාගමේ පොත් අනුව එය රු.9,987,145 ක් ලෙස දක්වා තිබුණි. එසේම එම සමාගම වෙත ගෙවිය යුතු ලෙස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන වල රු. 23,501,000 ක් දක්වා තිබුණද එම සමාගමේ ගිණුම් වල සංස්ථාවෙන් ලැබිය යුතු ලෙස කිසිදු අගයක් දක්වා නොතිබුණි.

(ආ) සංස්ථාවේ උප පරිපාලිත සමාගමක් වන එල් ආර් ඩී සී සේවා (පුද්ගලික) සමාගමෙන් සංස්ථාවට අයවිය යුතු ලෙස සංස්ථා මූල්‍ය ප්‍රකාශනවල රු.2,441,387 ක් දක්වා තිබුණද සමාගමේ පොත් අනුව එම ශේෂය රු.26,571 ක් විය. එසේම සංස්ථාව විසින් සමාගමට ගෙවිය යුතු රු.12,446,000 ක් සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

## 2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු. මිලියන 867 ක ණයගැති ශේෂය තුළ වර්ෂ 2ත් වර්ෂ 5ත් අතර කාලයක සිට හිඟ හිටි ණය ශේෂය රු.මිලියන 255 ක් හා වර්ෂ 5 ට වැඩි හිඟ හිටි ණය ශේෂය රු.මිලියන 24 ක් විය. එමෙන්ම මෙම ශේෂයන්ට අදාල ශේෂ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) දියත උයන දුම්රිය ආපන ශාලාව ඉදිකිරීම වෙනුවෙන් 2014 නොවැම්බර් 20 දින ශ්‍රී ලංකා යුධ හමුදාවට ලබා දුන් අත්තිකාරම් මුදලින් රු. 11,576,801 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අදාල වැඩ කටයුතු අවසන් වී වසර දෙකකට වැඩි කාලයක් ගතවී තිබුණද පියවා නොතිබුණි. එමෙන්ම මෙම අත්තිකාරම් ලබා දීමේදී කොන්ත්‍රාත්කරුගෙන් අත්තිකාරම් බැඳුම්කරද ලබාගෙන නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට කොළොන්නාව හා සාලමුල්ල නිවාස 216 ක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව (ඒ ගොඩනැගිල්ල) අවසන්ව වසර දෙකක් ගතවී තිබුණද නාගරික සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුතු රු.මිලියන 86.51 ක් හා රු.මිලියන 25.92 ක රැඳවුම් මුදල් අයකර ගැනීමට සංස්ථාව අපොහොසත්ව තිබුණි.

(ඈ) නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් ඉදිකරනු ලැබූ කොළොන්නාව හා සාලමුල්ල නිවාස 792 ක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ බිල්පත් ගෙවීම සඳහා (ගොඩනැගිලි බී සහ සී) සේවායෝජක විසින් ඉල්ලා තිබුණු පරීක්ෂණ වාර්තා ලබා දීමට සංස්ථාව අපොහොසත් වීම නිසා සංස්ථාවට ලැබිය යුතු පිළිවෙලින් රු. මිලියන 74.36 ක හා රු.මිලියන 30.89 ක රැඳවුම් මුදල් ලබා ගැනීමට නොහැකි වී තිබුණි. එමෙන්ම ඉදිකිරීම් කටයුතු අත්හිටුවා තිබීම නිසා සේවායෝජක ගෙවා තිබුණු රු.මිලියන 298.48 ක්වූ සවලීකරණ අත්තිකාරම් මුදල (Mobilization Advance) ආපසු ගෙවීමටද සංස්ථාව කටයුතු කර නොතිබුණි.

(ඉ) 2012 නොවැම්බර් 28 දින එල් ආර් ඩී සී (සේවා) සමාගමෙන් ණය පදනම මත ලබා ගෙන තිබුණු මෝටර් රථයක් වෙනුවෙන් එම සමාගමට ගෙවිය යුතු රු.මිලියන 3 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පියවා නොතිබුණි.

(ඊ) 1978 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා සංස්ථාව විසින් සංවර්ධනය නොකළ ඉඩම් විකිණීම වෙනුවෙන් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු.මිලියන 69.60 ක් ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉඩම් සංවර්ධනය කිරීම වෙනුවෙන් බාහිර පාර්ශවයන්ගෙන් සංස්ථාව වෙත ලැබී තිබුණු රු.මිලියන 966 ක් වූ ඉඩම් විකුණුම් තැන්පතු මුදලින් වර්ෂ 1 ත් වර්ෂ 3 ත් අතර කාලයකට අදාල රු.මිලියන 14.64 ක් හා වර්ෂ 05 කට වැඩි කාලයකට අදාල රු.මිලියන 489 ක් නිරවුල් කර නොතිබුණි.

(ඌ) ලංකා විදුලි බල මණ්ඩලයට අයත් මුතුරාජවෙල පිහිටි ඉඩමෙන් ඉවත්කර ගන්නා ලද වැලි වෙනුවෙන් සහ එම ඉඩම පරිහරණය කිරීම වෙනුවෙන් වර්ෂ 05 ක කාලයක සිට එම ආයතනයට ගෙවිය යුතු පිළිවෙලින් රු. මිලියන 180 ක් හා රු.මිලියන 171 ක් ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(එ) 2011 වර්ෂයේ සිට විදේශීය සමාගමක් වෙත සංස්ථාව ගෙවිය යුතුව තිබූ යූරෝ 575,000 ක මුදල පියවීමට කටයුතු නොකිරීම නිසා එම කාලපරිච්ඡේදය තුළ සිදුවූ විනිමය අනුපාත වල අවාසිදායක විචලනයන් හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ගෙවිය යුතු මුදල රු.මිලියන 90.78 ක් දක්වා වර්ධනය වී තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂය අවසානයට කොන්ත්‍රාත් ණයගිම් ශේෂය රු.මිලියන 385.76 ක් වූ අතර ඉන් වර්ෂ 2 ත් වර්ෂ 5 ත් අතර නිරවුල් නොකල ශේෂය රු.මිලියන 52.48 ක් විය.

(ඔ) සංස්ථාව විසින් උපකොන්ත්‍රාත්කරුවන්ගේ කොන්ත්‍රාත්වලින් සමාලෝචිත වර්ෂය අවසානයට රඳවාගත් රු.මිලියන 97.49 ක් නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණු අතර ඉන් වර්ෂ 2 කට වඩා වැඩි ශේෂය රු.මිලියන 23.57 ක් විය.

(ඕ) සංස්ථාව විසින් වැඩ අවසන් කළ කොන්ත්‍රාත් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු රඳවා ගැනීම් වටිනාකම වූ (Retention) රු.මිලියන 169.65 ක් අය කර ගැනිමට කටයුතු කර නොතිබුණු අතර ඉන් වර්ෂ 2 ට වැඩි ශේෂය රු.මිලියන 52.67 ක් විය. එය මුළු ලැබිය යුතු රඳවා ගැනීම් වටිනාකමින් සියයට 30 ක් විය.

(ක) සමාලෝචිත වර්ෂය අවසානයට සංස්ථාවට ලැබුණු වැඩ පූර්ව අත්තිකාරම් ශේෂය වූ රු.මිලියන 744.92 ක් නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණු අතර ඉන් වර්ෂ 2 ට වැඩි වටිනාකම රු.මිලියන 355.54 ක් විය. එමෙන්ම ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු වටිනාකම රු.මිලියන 65.09 ක් වූ අතර ඉන් වසර ඉක්මවූ ශේෂය රු.මිලියන 24.10 ක් විය.

(ග) සමාලෝචිත වර්ෂය අවසානයට සංස්ථාවේ වැඩබිම් සඳහා අවශ්‍ය විදුලිය ලබාගැනීමට ගෙවා තිබූ තැන්පතු රු.මිලියන 2.47 ක් එම ව්‍යාපෘති වල වැඩ අවසන්ව තිබුණද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.5 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

---

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීතිරීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1968 අංක 15 දරන ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථා පනත | |
| (i) 2(ආ) 1 වගන්තිය | දිවයින පුරා පලාත් මට්ටමින් පිහිටි පහත් වගුරු බිම්, නිසරු හෝ මඩ ඉඩම් හඳුනාගෙන අනවසර ඉඩම් ගොඩකිරීම් පාලනය කිරීම හා අධීක්ෂණය කිරීමට හැකිවන පරිදි ඒවා ගැසට් නිවේදන මඟින් ප්‍රසිද්ධ කිරීමට සංස්ථාව වෙත බලය පවරා තිබුණද සමාලෝචිත වර්ෂය අවසානයට එලෙස ගැසට් කරන ලද පලාත් ගණන 04 කට සීමා වී තිබුණි. |
| (ii) 8 (අ) වන වගන්තිය | පනතේ 2 වන වගන්තිය යටතේ ගොඩකිරීමට හා සංවර්ධනය කිරීමට පවරා ගනු ලබන ඉඩම්, ගොඩනැගිලි ඉදිකිරීමට, කර්මාන්ත වාණිජ්‍ය හා කෘෂිකාර්මික කටයුතු වෙනුවෙන් වැඩි දියුණු කළ යුතු වුවද, සංස්ථාව විසින් එලෙස 1995 වර්ෂයේ පවරාගත් මුතුරාජවෙල හා මුදුන් ඇල ප්‍රදේශවල ඉඩම් අක්කර 307ක ප්‍රමාණයෙන් සමාලෝචිත වර්ෂය අවසානයට වැඩි දියුණු කළ ප්‍රමාණය අක්කර 92 ක් එනම්, සියයට 30 ක පහල අගයක් විය. |

| | | |
|---|---|---|
| (ආ) | 1971 අංක 38 දරන මුදල් පනත 11 (බී) වගන්තිය | මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගැනීමෙන් තොරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ස්ථාවර හා කෙටිකාලීන තැන්පත්වල රු.මිලියන 3,333.82 ක් ආයෝජනය කර තිබුණි. |
| (ඇ) | 1982 අංක 04 දරන නාගරික සංවර්ධන අධිකාරිය(සංශෝධන) පනතේ 8 ඒ වගන්තිය | අදාළ පළාත් පාලන ආයතනය වෙතින් අනුමැතිය ලබාගැනීමකින් තොරව සංස්ථාව විසින් නව ප්‍රධාන කාර්යාල ගොඩනැගිලි සංකීර්ණය ඉදිකර තිබුණි. මෙම නිසා ඉදිරි වර්ෂ වලදී අනුමැතිය ලබාගැනීම වෙනුවෙන් රු.මිලියන 12.04 ක පමණ බැරකමක් උද්ගතව තිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | (i) මුදල් රෙගුලාසි 571 | සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ 05 ඉක්ම වූ කොන්ත්‍රාත් 14 ක රඳවා ගැනීමේ මුදල (Retention) වූ රු.මිලියන 9.47 ක් මුදල් රෙගුලාසි ප්‍රකාරව නිරවුල් කිරීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 700 (3) | රෙගුලාසියට පටහැනිව 2016 වර්ෂයේදී භාණ්ඩ අපහරණයේදී තෝරානොගත් ලංසුකරුවන් 23 දෙනෙකුගෙන් ලබා ගත් රු.365,000 ක තැන්පතු මුදල් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිදහස් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| | (iii) මුදල් රෙගුලාසි 774 | සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව විසින් අපහරණය කිරීම සඳහා තක්සේරු වටිනාකම රු. 1,631,490 ක්වූ භාණ්ඩ අයිතම 100 ක් හඳුනාගත්තද එම භාණ්ඩ ටෙන්ඩර් මගින් විකිණීම සඳහා රේඛීය අමාත්‍යාංශ ලේකම් වරයාගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණු අතර ඒ වෙනුවෙන් සමීක්ෂණ මණ්ඩලයක්ද පත්කර නොතිබුණි. |
| (ඉ) | 1993 නොවැම්බර් 26 දිනැති අංක 794/23 දරන අති විශේෂ ගැසට් පත්‍රය | සංස්ථාව විසින් ගොඩදමා තිබුණු මුහුදු වැලි කියුබික් මීටර් 4,478,679 ක් සඳහා ගෙවිය යුතු රාජ්‍ය භාගය රු.මිලියන 135.45 ක් වුවත් සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවා තිබූ වටිනාකම රු.මිලියන 32.05 ක් පමණක් විය. |
| (ඊ) | 1995 ජුලි 12 දිනැති අංක එස්ී1/එ/4/34 දරන රජයේ ඉඩම් අන්සතු කිරීමේ මාර්ගෝපදේශය | (i) චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය අවසාන වනවිට රජයේ ඉඩම් පර්චස් 93.15 ක් පෞද්ගලික අංශයට විකුණා තිබුණු අතර ඉඩම් කල්බදු දීමේදී ප්‍රධාන තක්සේරුකරු විසින් තක්සේරු කරන ලද කල්බදු වටිනාකම විශේෂ කමිටුවක් මගින් ඇගයීමට ලක්කර නොතිබුණි. |
| | | (ii) එමෙන්ම සංස්ථාව විසින් 2007 වර්ෂයේදී නිවාස ව්‍යාපෘතියක් ඉදිකිරීම වෙනුවෙන් සංස්ථාව සතු ඉඩමක් විකුණුම් ගිවිසුමක් මත පෞද්ගලික සමාගමකට ලබාදුන්නද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සමාගම එම නිවාස ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ආරම්භ නොකල බැවින් එම ඉඩම නැවත සංස්ථාවට අත්කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (උ) | 2015 ජුලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | චක්‍රලේඛයේ විධිවිධාන පරිදි සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂයේදී අපහරණය කළ තක්සේරු වටිනාකම රු.1,200,000 ක් වූ වාහන 17 ක තොරතුරු මහාභාණ්ඩාගාරයට හා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර අපහරණ වාහන විකුණුම් ආදායම ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි. |
| (ඌ) | 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 21 කදී රු.100,000 ඉක්මවා රු.5,819,819 ක තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදී තිබුණි. එමෙන්ම මෙම අත්තිකාරම්වලින් රු.1,452,500 ක් දින 10 ක් ඇතුලත පියවීමට කටයුතු කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නොපියවූ අත්තිකාරම් ශේෂය රු.82,316 ක් විය. |
| (එ) | 2015 දෙසැම්බර් 09 දිනැති අංක 02/2015 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව අධ්‍යක්ෂ මණ්ඩල නිර්දේශය මත සමාලෝචිත වර්ෂය සඳහා සේවකයකුට රු.13,500 ක් බැගින් රු.17,581,000 ක් දිරි දීමනා ලෙස ගෙවා තිබුණි. |
| (ඒ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.7 වගන්තිය | භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමෙන් තොරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පමණක් සමාලෝචිත වර්ෂයේදී කාර්ය මණ්ඩලය වෙත දිරි දීමනා ලෙස රු.මිලියන 39.22 ක් ගෙවා තිබුණි. |
| (ඔ) | 2013 මාර්තු 15 දිනැති අංක ඊඒ/පොදු/2013/14 දරන විදේශ සම්පත් දෙපාර්තමේන්තු චක්‍රලේඛය | චක්‍රලේඛයට අනුව විදේශ පුහුණු වැඩසටහන් වලට සහභාගි වන නිලධාරීන් ලබාගත් පුහුණුව පිළිබඳ වාර්තාවක් දිවයිනට පැමිණ මාසයක් ඇතුලත විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට ලබාදිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ නිලධාරීන් 32 දෙනෙකු විදේශ පුහුණු වැඩසටහන්වලට සහභාගි වී තිබුණද එවැනි වාර්තාවක් ලබාදී නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළදී සමූහයේ හා සංස්ථාවේ බදු පසු ලාභය පිළිවෙලින් රු.මිලියන 729.95 ක් හා රු.මිලියන 702.56 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අලාභය පිළිවෙලින් රු.මිලියන 91.56 ක් හා රු.මිලියන 157.39 ක් විය. මේ අනුව ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ සමූහයේ හා සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵලවල පිළිවෙලින් රු.මිලියන 821.51 ක හා රු.මිලියන 859.95ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. වේරස් ගඟ වැසි ජලය අපවහන ව්‍යාපෘතිය වෙනුවෙන් මහා භාණ්ඩාගාරයෙන් අයවිය යුතු රු.මිලියන 3,332.94 විලම්භිත ආදායමක් සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවේ ආදායමක් ලෙස දැක්වීම මූල්‍ය ප්‍රතිඵලවල වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේදී රු.මිලියන 68.17 ක අලාභයක් පැවතියද 2013 සහ 2014 වර්ෂවල පිළිවෙලින් රු.මිලියන 103.89 ක හා රු.මිලියන 346.69 ක ලාභයක් උපයාගෙන තිබුණි. නැවතත් 2015 වර්ෂයේදී එය රු.මිලියන 157.39 ක අලාභයක් බවට පත්ව තිබුණද සමාලෝචිත වර්ෂයේදී ලාභය රු.මිලියන 702.56 ක් විය. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී සංස්ථාවේ දායකත්වය 2012 වර්ෂයේ සිට ධන අගයක් ලෙස අඛණ්ඩව වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 1,337.39 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

### 4.1 කාර්යසාධනය

-------------------

2006 අංක 35 දරන ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථා පනතට අනුව, ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කර ඇති ඉඩම් ගොඩකිරීම හා සංවර්ධනය කිරීම සහ එම ඉඩම්, ගොඩනැගිලි, කාර්මික, වාණිජ හෝ කෘෂිකාර්මික කටයුතු සඳහා යෝග්‍ය තත්ත්වයට පත් කිරීම, එකී ඉඩම් වල භාරකාරත්වය කළමනාකරණය හා පාලනය, එම ඉඩම් ගොඩකිරීම හා සංවර්ධනය කිරීමට යටත්ව භාරව සිටීම, ඉංජිනේරු ක්ෂේත්‍රයේ ඉදිකිරීම් කටයුතු සහ උපදේශන පැවරුම් කාර්යය භාර ගැනීම, සහ ඇල මාර්ගවල භාරකාරත්වය, වැඩි දියුණු කිරීම, නඩත්තුව, පාලනය සහ ඇල මාර්ග දූෂණය වීමෙන් වලක්වා ගැනීම සංස්ථාවේ ප්‍රධාන අරමුණු සහ කාර්යයන් වේ. මෙකී අරමුණු ඉටුකර ගැනීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්‍ෂණ කරනු ලැබේ.

(අ) 1996 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව මහ කොළඹ ගංවතුර පාලනය සහ පාරිසරික වැඩිදියුණු කිරීම් ව්‍යාපෘතිය මෙහෙයවීම යටතේ පාර්ලිමේන්තු සංකීර්ණයට බටහිර මායිමේ පිහිටි අක්කර 1000 ක පමණ වූ පහත් බිම් ප්‍රදේශ ජල රැඳවුම් ප්‍රදේශ ලෙස ආරක්ෂා කර ගැනීමට සහ පාලනය කිරීමට ඒ පිළිබඳ විශේෂඥ ආයතනය වන ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට පවරා තිබුණි. එසේ පැවරුණු ඉඩම් වල අනවසර පදිංචිවීම් හා අනවසර ගොඩකිරීම් ඉවත් කිරීමේ සම්පූර්ණ වගකීම (Sole Responsibility) සංස්ථාවට පැවරී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් ඉඩම් අක්කර 200 ක් පමණ අනවසර පදිංචි කරුවන් විසින් අත්කරගෙන තිබීම හා තවත් අක්කර 200 ක් පමණ සංස්ථාව විසින් අවසතු කරනය (Divesting) කර තිබීම හේතුවෙන් අමාත්‍ය මණ්ඩලය විසින් සංස්ථාවෙන් අපේක්ෂා කරන ලද කාර්යය ඉටුකිරීමට සංස්ථාව අපොහොසත්ව තිබුණි. ඉහත ප්‍රදේශ අහිමි වීමට සාපේක්ෂව වැසි ජලය පිටතට ගලායාමේ ධාරිතා (Out Fall Capacity) වැඩිකිරීමට සංස්ථාව ප්‍රමාණවත් පියවර නොගැනීම ජල ගැලීම් ඇතිවීමට සෘජුව බලපා තිබුණි. එමෙන්ම අනවසර පදිංචිකරුවන් පදිංචි ඉඩම්වල මායිම් නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීමට 2013 වර්ෂයේදී ආරම්භ කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම කටයුතු අවසන්ව නොතිබුණි.

(ආ) සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 කට අදාලව ජල රැඳවුම් ප්‍රදේශ තුල සිදුකර ඇති අනවසර ඉදිකිරීම් සහ ගොඩකිරීම් 673 ක් හඳුනාගෙන තිබුණද එම හඳුනාගත් ඉදිකිරීම් ඉවත් කිරීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

(ඇ) මුතුරාජවෙල වගුරු බිම් වෙනුවෙන් තෙත් බිම් කළමනාකරණ ක්‍රියාකාරී සැලසුමක් පිළියෙල කිරීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් රු.මිලියන 30 ක් සමාලෝචිත වර්ෂයේදී වෙන්කර තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටද එම සැලැස්ම පිළියෙල කර නොතිබුණු අතර එදිනට භෞතික ප්‍රගතිය සියයට 24 ක්ව පැවතුණි.

(ඈ) සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය තුලදී රු.මිලියන 361.87 ක ව්‍යාපෘති 13 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමකින් තොරව ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් නොවූ ව්‍යාපෘති 14 ක් ක්‍රියාත්මක කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 626.13 ක් වැය කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට දියත උයන පබ් (Pub) ශාලාවේ ඉදිකිරීම් සඳහා රු.මිලියන 14.61 ක් වැය කර එහි ප්‍රගතිය සියයට 34 ක් ව පැවතියදී එහි ඉදිකිරීමේ වැඩ අතහැර දමා තිබුණි. වැඩ අත්හැර දැමීමට හේතු විගණනයට පැහැදිලි නොකෙරුණි. තවද සංස්ථාව විසින් මූලික ශක්‍යතා අධ්‍යනයකින් තොරව රු.මිලියන 33.32 ක් වැය කර ඉකුත් වර්ෂයේ ඉදිකරන ලද දියත උයන දුම්රිය ආපන ශාලාව සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණු අතර ආපන ශාලාවේ පැසෙන්ජර් යුනිට් හා ෆුඩ් ස්ටෝල් භාවිතයට ගත නොහැකි ආකාරයට හානිවී තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී නව ව්‍යාපාර යෝජනා ලෙස සංස්ථාවට අයත් කිරිමණ්ඩල මාවතේ සහ රාගම ඉඩම්වල නිවාස යෝජනා ක්‍රම 02 ක් ඉදිකිරීමට සංස්ථාවේ සැලසුම් හා ව්‍යාපාර සංවර්ධන අංශය විසින් සැලසුම් කර තිබුණද 2017 ජුලි වන විටත් එම නිවාස ක්‍රම වලට අදාල සැලසුම් පිළියෙල කර නොතිබුණි.

(උ) කොළඹ අගනගර නාගරික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ 2012 වර්ෂයේදී කොන්ත්‍රාත් 19 ක් සංස්ථාවට පවරා තිබුණු අතර එම කොන්ත්‍රාත් 2019 වර්ෂයේදී නිමකළ යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට ඉන් වැඩ නිම කරන ලද කොන්ත්‍රාත් ගණන 03 ක් වූ අතර රු.මිලියන 523.95 ක් වටිනා කොන්ත්‍රාත් 04 ක වැඩ කෙරෙමින් පැවතුණි. ඒවායේ භෞතික ප්‍රගතිය සියයට 25 පහල අගයක පැවති අතර අනෙක් කොන්ත්‍රාත් 12 මූලික සැලසුම් අදියරෙහි පැවතුණි. එමෙන්ම ව්‍යාපෘතිය මගින් සංස්ථාවට රු.මිලියන 14,733 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපෘතිය ආරම්භ කර වසර 3 ½ ක් ගත වුවද භාවිතයට ගත් ප්‍රතිපාදන වටිනාකම රු.මිලියන 1,253 ක් හෙවත් වෙන්කරන ලද ප්‍රතිපාදන වටිනාකමින් සියයට 8.5 ක් පමණක් විය.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දියත උයන දුම්රිය ආපන ශාලාව පිහිටි භූමියෙහි නීත්‍යානුකූල අයිතිය සංස්ථාවට පවරා ගැනීමට කටයුතු නොකිරීම නිසා ආපන ශාලාවේ කටයුතු ඇරඹීම සඳහා බාහිර පාර්ශවයන් සමඟ නීත්‍යානුකූල ගිවිසුම්වලට එළඹීමේ බාධාවන් ඇතිවී තිබුණි. තවද මෙම භූමිය නාගරික සංවර්ධන අධිකාරිය විසින් අනාගතයේදී සිය සංවර්ධන කටයුතු සඳහා පවරා ගැනීමේ අවදානමක්ද ඇතිවී තිබුණි.

(ආ) සංස්ථාව විසින් පිටකෝට්ටේ 9 වන පටුමගේ පිහිටි අක්කර 05 ක් පමණ වූ ඉඩමෙහි සුපිරි නිවාස සංකීර්ණයක් ඉදිකිරීම සඳහා 2007 වර්ෂයේ සංවර්ධනකරුවකු සමඟ විකුණුම් ගිවිසුමක් ඇති කර ගෙන තිබූ අතර එය 2010 වර්ෂයේ නිම කළ යුතු විය. මෙම ඉඩම සංවර්ධනය කිරීම සඳහා සංවර්ධනකරුගෙන් රු.මිලියන 489 ක අත්තිකාරමක් ලබාගෙන තිබුණි. 2017 ජුනි 30 දක්වාම අදාල සංවර්ධන කටයුතු ආරම්භ කිරීමට සංවර්ධනකරු කටයුතු කර නොතිබුණද අදාළ ගිවිසුම අවලංගු නොකිරීම හේතුවෙන් නැවත මෙම ඉඩම සුදුසු සංවර්ධනකරුවෙකුට පැවරීමට ඇති අවස්ථාව සංස්ථාවට අහිමි වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට සුදු නෙළුම් නිවාස ව්‍යාපෘතියේ නිවාස ලාභීන්ගෙන් ලැබිය යුතු හිඟ හිටි වාරික හා පොළී වටිනාකම රු. මිලියන 20.56 ක් අයකර ගැනීමට ගිවිසුම් ගත කොන්දේසි වලට අනුව සංස්ථාව විසින් කිසිදු නීතිමය පියවරක් ගෙන නොතිබුණු අතර එම මුදලින් රු.මිලියන 20.15 ක් වෙනුවෙන් බොල්ණය ප්‍රතිපාදනයක්ද කර තිබුණි.

(ඈ) සංස්ථාවේ නව ව්‍යාපාරික අවශ්‍යතා නිර්ණය කර ගැනීමටත්, පවතින වෙළඳපල කොටස පුළුල් කර ගැනීමේ අවශ්‍යතාවයක් මත සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව විසින් සැලසුම් හා ව්‍යාපාර සංවර්ධන අංශයක් ස්ථාපිත කලද, එම අංශය මගින් ඉටුකල යුතු කාර්යයන් මොනවාද යන්න හඳුනාගෙන නොතිබුණි.

(ඉ) සංස්ථාව වෙත පැවරී ඇති කිත්තම්පහුව ඇල රක්ෂිතය තුල පිහිටි ඉඩම් කොටස් 05 ක් වාර්ෂිකව බදු කුලී පදනම මත බදු කරුවන්ට ලබාදී තිබුණද සංස්ථාව විසින් 2012 වර්ෂයේ සිට ඔවුන් සමග බදු ගිවිසුමකට එළඹ නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට අයකර නොගත් බදු කුලී ආදායම රු.මිලියන 2.92 ක් විය.

(ඊ) සංස්ථාවේ කතරගම හා නුවරඑළිය සංචාරක බංගලා වලින් උපයාගත් ආදායම රු.මිලියන 3.45 ක් වුවද ඒ වෙනුවෙන් දරන ලද වියදම රු.මිලියන 6.62 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේදී ලැබූ අලාභය රු.මිලියන 3.17 ක් විය.වියදමට සරිලන ගාස්තු ක්‍රමයක් හඳුනාගැනීමට කළමනාකරණය අපොහොසත්වීම මෙම තත්ත්වයට බලපා තිබුණි.

(උ) කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය මගින් 2014 වර්ෂයේදී සංස්ථාවට නීත්‍යානුකූලව පවරා තිබුණු ජීප් රථය නැවත එම ව්‍යාපෘතිය විසින් රැගෙන ගොස් තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එය ආපසු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) ලුනාව ව්‍යාපෘතිය යටතේ සංස්ථාවේ කටයුතු වෙනුවෙන් 2012 වර්ෂයේදී ලබාදුන් වාහන 02 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ජල සම්පාදන අමාත්‍යාංශයේ ධාවන කටයුතු සඳහා යොදා ගෙන තිබුණද එම වාහන සංස්ථාවට නැවත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම 2013 වර්ෂයෙන් පසුව මෙම වාහන පිළිබඳ සංස්ථාව විසින් කිසිදු පසු විපරමක්ද සිදු කර නොතිබුණි.

(එ) අභ්‍යන්තර විගණන අංශය මඟින් සිදු කරන ලද අභ්‍යන්තර විගණන පරීක්ෂාවේදී සංස්ථාව විසින් වැඩ බිම්වල ඇති යන්ත්‍රෝපකරණ සඳහා ඉන්ධන නිකුත් කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ මනා අධීක්ෂණයක් සිදු නොවන බව අනාවරණය වී තිබූ අතර ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 10.96 ක් වටිනා ලීටර 115,268 ක ඉන්ධන අවභාවිතයක් සිදුවී තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂය අවසානයට සංස්ථාවේ වාහන 57 ක් ප්‍රවාහන අංශභාර නිලධාරියාගේ අධීක්ෂණයකින් තොරව එක් එක් අංශ වල ධාවනයට යොදාගෙන තිබුණි. මෙම තත්ත්වය මත ඇතැම් වාහන ප්‍රමාණවත් ධාවනයක් සිදු කර නොතිබියදී සංස්ථාවේ ධාවන කටයුතු වෙනුවෙන් කුලී වාහන 25 ක් යොදාගෙන ඒ වෙනුවෙන් රු.මිලියන 4.84 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

(ඔ) වර්තමානයේ සිදුවන අනවසර ඉඩම් ගොඩකිරීම් වලක්වාලීමට සංස්ථා පනතේ පවතින විධිවිධාන ප්‍රමාණවත් නොවන බැවින් එම වගන්ති නිවැරදි කර පනත සංශෝධනය සඳහා 2012 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පනත සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම පනතේ පවතින මෙවැනි අඩුපාඩු මත පසුගිය වර්ෂ වලදී අනවසර ඉඩම් ගොඩකිරීම් සම්බන්ධව සංස්ථාවට ලැබෙන පැමිණිලි වෙනුවෙන් ප්‍රමාණවත් පියවරයන් ගෙන නොතිබුණි.

**4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

**---------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කොලොන්නාව සාලමුල්ල නිවාස ඉදිකිරීම (ඒ.බී.සී.ගොඩනැගිලි ) වෙනුවෙන් සංස්ථාව සතු අක්කර 04 ක පමණ ඉඩමක් යොදාගෙන තිබුණු අතර එම ඉඩමේ වටිනාකම වූ රු.මිලියන 171ක් නාගරික සංවර්ධන අධිකාරියෙන් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) 1981 වර්ෂයේ සිට 2005 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය තුල සංස්ථාව විසින් පවරා ගත් ඉඩම්වලට අදාල වන්දි මුදල් කාලීනව ගෙවීමට කටයුතු නොකිරීම නිසා එම ඉඩම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු වන්දි මුදල රු. මිලියන 90.72 ක් වූ අතර ඊට අදාළව ගෙවිය යුතු පොළිය රු. මිලියන 103.06 ක් හෙවත් ගෙවිය යුතු වන්දි මුදල මෙන් සියයට 113 ක් විය. අදාල වන්දි ගෙවීමේ කාර්යය කඩිනම් කර පොළී ගෙවීම අවම කර ගත හැකි අයුරින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමඟ මනා සම්බන්ධීකරණයක් පවත්වා නොගැනීම මෙම තත්ත්වයට සෘජුව බලපා තිබුණි. එමෙන්ම ඉඩම් පවරා ගැනීම සඳහා අවුරුදු 11 සිට අවුරුදු 35 දක්වා කාල පරාසයක් ගතවී තිබීම හේතුවෙන් මෙම ඉඩම් වල අනවසර පදිංචිකරුවන් සිටින බවද වැඩි දුරටත් අනාවරණය විය.

(ඇ) ඒකල මඩම හන්දිය, වාලුකාරාම පන්සලට යාබද අක්කර 04 ක පමණ ඉඩම අනවසරයෙන් ගොඩ කරන බව හා ඒ වෙනුවෙන් කඩිනමින් පියවර ගන්නා ලෙසට ජා ඇල ප්‍රාදේශීය ලේකම්වරයා 2016 අගෝස්තු 08 දිනැති ලිපිය මගින් සංස්ථාවේ සාමාන්‍යාධිකාරීවරිය දැනුවත් කර තිබුණි. මේ සම්බන්ධව සාමාන්‍යාධිකාරි තුමිය ලබාදුන් උපදෙස් පරිදි සංස්ථාවේ ආරක්ෂක අංශය උක්ත දිනම ස්ථානීය පරීක්ෂණයක් සිදු කර පරීක්ෂණ වාර්තාව 2016 අගෝස්තු 12 දින සාමාන්‍යාධිකාරීවරිය වෙත බාරදී තිබුණු අතර ඉඩම අනවසරයෙන් ගොඩකළ පුද්ගලයාට 2016 අගෝස්තු 18 දින සංස්ථාවට පැමිණෙන ලෙස දන්වා තිබුණි.

මේ සම්බන්ධව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2016 අගෝස්තු 08 දින සිට 11 දින දක්වා උක්ත අනවසර ගොඩකිරීම සම්බන්ධව මාධ්‍ය ආයතන, රාජ්‍ය ආයතන හා ජනතාව හරහා පැමිණිලි විශාල ගණනක් සංස්ථාවට ලැබුණද වහාම පරීක්ෂණයක් සිදු නොකර ස්ථානීය පරීක්ෂාවෙන් දින 10 කට පසු පැමිණිලි විභාග කිරීමට නියම කිරීම නිසා එම කාලය තුලදී ඉඩම සම්පූර්ණයෙන්ම අනවසර ලෙස ගොඩකර ගැනීමට අවස්ථාව සැලසී තිබුණි. පැමිණිල්ල විභාගයට දිගු කාලයක් ගතවීම, නිතර ස්ථානීය පරීක්ෂණ සිදු නොකිරීම , පරීක්ෂණ වාර්තා ලබාදීම ප්‍රමාද වීම හා කඩිනම් නීති කටයුතු නොකිරීම හේතුවෙන් ඉඩම් හිමිකරුගේ අභිමතය පරිදි ඉඩම අනවසරයෙන් ගොඩ කර ගෙන ඇති බව නිරීක්ෂණය විය.

(ii) මෙම පැමිණිල්ල ලැබී මාසයකට වැඩි කාලයක් ගතවීමෙන් පසුව, එනම් 2016 සැප්තැම්බර් 14 දින යථෝක්ත ගොඩකිරීම සම්බන්ධව සංස්ථාවේ තෙත් බිම් කළමනාකරණ අංශය ස්ථානීය පරීක්ෂණ වාර්තාවක් (Inspection Report) ලබාදී තිබුණද එම වාර්තාවේ අනවසර පිරවීම් ප්‍රමාණය හා මායිම්ද, වැහි වතුර බැසයාමේ මාර්ග හා ජල ගැලීම් තත්ත්වයකදී වන බලපෑමද හඳුනාගෙන වාර්තා කර නොතිබුණු අතර ජල ගැලීම් රටාව (Storm Water behavior and flood vulnerability) පිළිබඳවද විශ්ලේෂණයක්ද සිදුකර නොතිබුණි. මෙම තත්ත්වය මත වාර්තාව පරිශීලනය කරන බාහිර පාර්ශවයන්ට (විශේෂයෙන් අධිකරණයට) අනවසර ගොඩකිරීම හේතුවෙන් සිදුවන හානිය පිළිබඳ ප්‍රමාණවත් අවබෝධයක් නොලැබෙන බව විගණනයේදී අනාවරණය විය.

(iii) එමෙන්ම 2016 ඔක්තෝබර් 14 දින එනම් පැමිණිල්ල ලැබී මාස 02 කට වැඩි කාලයක් ගතවූ පසු සංස්ථා පනතේ බලතල අනුව අනවසර ගොඩකිරීම සම්බන්ධයෙන් සංස්ථාව නඩු පවරා තිබුණද විෂයගත ඉඩම ජා ඇල නගර සභා බල ප්‍රදේශය තුල පිහිටි පහත්, වගුරු, මුඩු හෝ ගොහොරු ඉඩමක් ලෙස සනාථ කිරීමට මෙන්ම අනවසර ගොඩ කිරීම හේතුවෙන් ප්‍රදේශයේ වැසි ජලය ගලායාම හා ජල ගැලීම් රටාවට වන අහිතකර බලපෑමද විස්තර කිරීමට සංස්ථාව අපොහොසත් වීම මත අධිකරණය විසින් නඩුව ප්‍රතික්ෂේප කර තිබුණි. මෙවැනි දුර්වලතාවයන් අනවසර ගොඩකිරීම් වලක්වාලීමට බාධාවක් බව නිරීක්ෂණය කෙරේ.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී අපහරණය කිරීමට හඳුනාගත් භාණ්ඩ හා උපකරණ අයිතම 100 කින් අයිතම 42 ක් අපහරණය කිරීමෙන් තොරව ගබඩාවේ රඳවා ගෙන තිබුණි.

**4.4** මතභේදයට තුඩුදෙන ගනුදෙනු

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවේ අරමුණුවලට පටහැනිව 2014 වර්ෂයේදී හම්බන්තොට දිස්ත්‍රික්කයේ හිටපු දේශපාලකයකුගේ අනුස්මරණ කෞතුකාගාරයක් සහිත ස්මාරකයක් එම දිස්ත්‍රික්කය තුළ ඉදිකිරීම වෙනුවෙන් සංස්ථාවට අයවිය යුතු රු.මිලියන 31.31 ක මුදල ජනප්‍රිය ශිල්පීන්ගේ විවිධ ප්‍රසංග මඟින් රැස්කර ගත යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් එලෙස මුදල් රැස්කර ගෙන නොතිබුණි.

එම මුදලට අමතරව සංස්ථාව විසින් ඉදිකිරීමේ ද්‍රව්‍ය ලබා ගැනීම වෙනුවෙන් ශ්‍රී ලංකා නාවික හමුදාවට රු.මිලියන 25 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට එම අත්තිකාරම් මුදලින් රු.මිලියනයක් තවදුරටත් පියවාගෙන නොතිබුණි.

(ආ) ලෝක බැංකු ආධාර මත ක්‍රියාත්මක වන කොළඹ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව විසින් වැයකරන ලද රු. මිලියන 46.36 ක ව්‍යාපෘති වියදම් අදාළ ව්‍යාපෘතියෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂයේදී අපහරණය කිරීමට සැලසුම් කළ හා තත්ත්ව වාර්තා ලබාගත යුතු යැයි නිර්දේශිත වාහන 09 ක තත්ත්ව වාර්තා (Condition Report) ලබා ගැනීමකින් තොරව මිල ලංසු ලබාගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් වාහන අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) මහකොළඹ ගංවතුර පාලනය සහ පාරිසරික වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ ජල රැඳවුම් ප්‍රදේශ ලෙස වෙන්කර තැබීමට සංස්ථාව විසින් පවරාගත් නාවල - හීන් ඇල ජල රක්ෂිත ප්‍රදේශ තුල පැවති හෙක්ටයාර 02 ක භූමියක ක්‍රිකට් ක්‍රීඩාංගනයක් ඉදිකර තිබුණි.

(ඉ) වෙරස්ගහ වැසි ජලය අපවහන හා පරිසරය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂයේදී ප්‍රදානය කළ උපකොන්ත්‍රාත් 07 ක් සඳහා වැඩ පූර්ව අත්තිකාරම් වශයෙන් රු.මිලියන 37.31 ක් උපකොන්ත්‍රාත් කරුවන්ට ගෙවා තිබුණද ඔවුන් ඉදිරිපත් කල අන්තර් බිල්පත්‍ර වලින් අයකර ගත යුතු සියයට 10 ක වැඩ පූර්ව අත්තිකාරම් වටිනාකම අය කර ගැනීමට වර්ෂය තුලදී කටයුතු කර නොතිබුණි. එමෙන්ම උපකොන්ත්‍රාත් කරුවන්ගේ කලවැඩ සහතික කිරීමකින් තොරව හා මැනුම්පත්‍ර ලබා ගැනීමකින් තොරව ඔවුන් විසින් කරන ලද ඉල්ලීම් මත සංස්ථාව විසින් රු.මිලියන 22.20 ක් ගෙවා තිබුණි.

## 4.5 දෘශ්‍ය අක්‍රමිකතා

--------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාව විසින් ක්‍රියාත්මක කරනු ලබන භාණ්ඩාගාර ව්‍යාපෘතීන්ට අදාල පිරිවැය තුල සංස්ථාවේ පොදුකාර්ය වියදම්ද ඇතුලත්ව තිබියදී සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩාගාරයෙන් ලද රු.මිලියන 2,296.80 ක ප්‍රාග්ධන ප්‍රදානවලින් විධිමත් අනුමැතියකින් තොරව රු.මිලියන 1042.38 ක් එනම් සියයට 45 ක් සංස්ථාවේ පොදුකාර්ය වියදම් ලෙස ලබා ගෙන තිබුණි. එලෙස අයකරනු ලබන වටිනාකම සංස්ථාවේ ශුද්ධ ලාභයක් වන බවද විගණනයේදී වැඩි දුරටත් අනාවරණය විය. එම වටිනාකම සංස්ථාවේ දල ලාභයේ ප්‍රතිශතයක් ලෙස සියයට 69 ක් විය. ඊට අමතරව සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂයේදී දරන ලද වැටුප් හා වේතන වටිනාකමින් සියයට 40ක් මහා භාණ්ඩාගාර ප්‍රදාන මගින් ප්‍රතිපූර්ණය කරගෙන තිබුණි.

(ආ) සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය තුල අමාත්‍යාංශ ප්‍රදාන මත ක්‍රියාත්මක කල ව්‍යාපෘති 03 ක් සඳහා කල වැඩ සහතික කිරීමකින් තොරව අන්තර් බිල් පමණක් ඉදිරිපත් කර රු.මිලියන 88.12 ක් ලබා ගෙන තිබුණි.

(ඇ) හෝටල් සමාගමකින් සංස්ථාව ලබාගෙන තිබුණු සේවාවන් සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වන විට ගෙවිය යුතු රු.1,568,248 ක් මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබූ අතර ලබා ගන්නා ලද සේවාවන්වල විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

## 4.6 ආර්ථික නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවේ නීතිඥයන් සිව්දෙනෙකුගෙන් සමන්විත නීති අංශයක් ස්ථාපිතව පැවතියදී නීති වියදම් වශයෙන් සමාලෝචිත වර්ෂයේදී බාහිර නීතිඥයන් වෙත රු. මිලියන 1.82 ක් ගෙවා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව විසින් මාසික කුලිය රු.105,000 ක් හා උපරිම ධාවනය කිලෝමීටර 1500 ක්ද අමතර ධාවනයන් වෙනුවෙන් කිලෝමීටරයකට රු.75 ක් බැගින් ගෙවන පරිදි කැබ් රථ 10 ක් කුලී පදනම මත ලබාගෙන තිබුණි. ඉන් වාහන 08 ක් පිළිබඳ සිදුකරන ලද නියදි විගණන පරීක්ෂාවේදී එම රථවල මාසික ධාවනය කිලෝමීටර 2000 ත් 3000 ත් අතර පවතින බව අනාවරණය විය. නමුත් සංස්ථාව විසින් මාසික ධාවනය කල හැකි උපරිම කිලෝමීටර ගණන වන කිලෝමීටර 1500 සීමාව වැඩි කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් උපරිම සීමාව ඉක්මවා අතිරේකව ධාවනය කරන ලද කිලෝමීටර් 35,502 ක් වෙනුවෙන් රු.මිලියන 2.57 ක් ගෙවීමට සිදුවී තිබුණි. තවද සංස්ථාවට වාසිදායක වන අයුරින් ඇතැම් කුලී වාහන වල මාසික ධාවනය කල හැකි සීමාවන් උපරිම ලෙස භාවිතයට ගැනීමට ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුණි.

(ඇ) මහ කොළඹ ගංවතුර පාලනය සහ පාරිසරික වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ සංස්ථාවට පැවරුණු ඉඩම් හෙක්ටයාර 378 ක් 1996 අගෝස්තු 15 දිනැති අංක 96/1760/111/125 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි කෙටිකාලීන බදු පදනම මත ලබාදීමට සංස්ථාව කටයුතු කර නොතිබීම හේතුවෙන් වර්ෂ 20 කට වැඩි කාලයක සිට සංස්ථාවට රැස්කර ගත හැකිව තිබූ විශාල බදු කුලී ආදායමක් අහිමි ව තිබුණි.

## 4.7 ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් ක්‍රියාවලිය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසන් වන විට දියත උයන ඉදිකිරීමේ වැඩ කටයුතු නිමකළ යුතු දිනය වසර දෙකකින් ඉක්ම වී තිබුණ ද එහි කටයුතු අවසන්ව නොතිබුණු අතර ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය රු.මිලියන 52.69 ක් හෙවත් ඇස්තමේන්තු වටිනාකමින් සියයට 42 ක් පමණ විය.

(ආ) කොලොන්නාව හා සාලමුල්ල ප්‍රදේශවල නිවාස 792 ක් ඉදිකිරීමේ (ගොඩනැගිලි බී සහ සී) කොන්ත්‍රාත්තුවේ කල වැඩ වටිනාකම රු. මිලියන 653.02 ක් වුවද සහතික කරන ලද වටිනාකම රු.මිලියන 281.34 ක් වූ අතර ඉතිරි කළ වැඩ වටිනාකම වූ රු.මිලියන 371.68 ක් වසර දෙකකට වැඩි කාලයක් ගත වුවද සහතික කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී වැඩ අවසන් කළ යුතු රු. මිලියන 340 ක් වටිනා කොන්ත්‍රාත් 04 ක සමාලෝචිත වර්ෂය අවසානයට භෞතික ප්‍රගතිය සියයට 1 ත් සියයට 24 ත් අතර පහළ අගයක පැවතුණි.

(ඈ) සංස්ථාව විසින් නිසි මූලික අධ්‍යයනයකින් හා සැලසුමකින් තොරව බොල්ගොඩ ඇලෙහි ඉවුරු සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හේතුවෙන් එම ඇල ඉවුරු කඩා වැටී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේද ඇල ඉවුරු නැවත ප්‍රතිසංස්කරණය සඳහා රු.950,000 ක් වැය කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුල සංස්ථාව විසින් වැඩ නිමකල ව්‍යාපෘති 14 ක ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 1,156.50 ක් වුවද සත්‍ය වියදම රු. මිලියන 274.40 ක් වීමෙන් සියයට 76 ක විචලනයක් නිරීක්ෂණය වූ අතර තවත් ව්‍යාපෘති 10 ක ඇස්තමේන්තුගත පිරිවැය ඉක්මවා රු.මිලියන 943.54 ක් වැය කරද තිබුණි.මනා මූලික අධ්‍යනයකින් තොරව ව්‍යාපෘති සැලසුම් පිළියෙල කිරීම හේතුවෙන් මෙම තත්ත්වය ඇති වී තිබුණු බව නිරීක්ෂණය විය.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ 05 ඉක්මවූ සංස්ථාව විසින් ඉටුකරනු ලැබූ කොන්ත්‍රාත් 08 ක් වෙනුවෙන් ඉදිරිපත් කල ඉන්වොයිස් වටිනාකමින් සේවායෝජක විසින් සහතික නොකල වැඩ වටිනාකම රු.මිලියන 35.90 ක් වූ අතර වර්ෂ 01 ත් 05 ත් අතර කොන්ත්‍රාත් 27 වෙනුවෙන් ඉන්වොයිස් කරන ලද වටිනාකමින් සහතික නොකරන ලද කල වැඩ වටිනාකම රු.මිලියන 646 ක් විය. සංස්ථාව විසින් නියමිත කාලරාමුව තුල ඉන්වොයිස් ඉදිරිපත් නොකිරීම, මූලික සැලසුම් වෙනස්වීම හා කොන්ත්‍රාත් වල අඩුපාඩු පැවතීමට සෘජුව බලපා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව විසින් මූලික ශක්‍යතා අධ්‍යයනයකින් තොරව මාදින්නාගොඩ අතුරු ප්‍රවේශ මාර්ගයක් ඉදිකිරීම සඳහා රු.මිලියන 52 ක් වැය කර තිබුණද මාර්ගය ඉදිකිරීමේ අවශ්‍යතාවය විගණනයට පැහැදිලි නොකෙරුණි. එමෙන්ම වගුරු බිමක් ගොඩකරමින් මෙම මාර්ගය සකස් කර තිබුණු බැවින් පුරවනු ලබන පස් පිළිබඳ පරීක්ෂාවක් සිදුකර තහවුරුවක් ලබා ගත යුතු වුවද සංස්ථාව එලෙස කටයුතු කර නොමැතිබව ස්ථානීය විගණන පරීක්ෂාවේදී අනාවරණය විය.

(ඌ) 2013 අගෝස්තු 30 දිනැති අංක 13/1144/503/087 දරන කැබිනට් මණ්ඩල තීරණයක් මත වේරස්ගඟ වැසි ජලය අපවහන හා පරිසරය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කොට ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 14,227 ක ණය මුදලක් මහා භාණ්ඩාගාර ඇපකරය මත ජාතික ඉතිරිකිරීමේ බැංකුව මඟින් සංස්ථාව වෙත ලබා දී තිබුණි. ඒ අනුව සංස්ථාව විසින් 2014 ජූලි 14 දින වසර 14 ½ කින් ණය මුදල ආපසු ගෙවීමේ එකඟතාව මත ජාතික ඉතිරි කිරීමේ බැංකුව සමඟ ණය ගිවිසුමකට එළඹ තිබුණි. නුගේගොඩ, රත්තනපිටිය, බොරලැස්ගමුව, පිළියන්දල හා වේරහැර ප්‍රදේශ වල වර්ෂා සමයේ හටගන්නා ගංවතුර පාලනය කිරීම , පවතින ඇළ මාර්ග පුළුල් කිරීම, ඇළ ඉවුරු ආරක්ෂාව, ගංවතුර රැඳවුම් ප්‍රදේශ ආරක්ෂාකරමින් වැව් ඉදිකිරීම, නව බෝක්කු හා පාලම් ඉදිකිරීමද ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු විය.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2013 ඔක්තෝබර් 04 දින ආරම්භ වී 2018 ඔක්තෝබර් 24 වසර 5 කින් ව්‍යාපෘතිය නිමකිරීමට අපේක්ෂා කර තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ව්‍යාපෘතිය සඳහා වසර 03කට අධික කාලයක් ගතවී තිබුණු බැවින් ව්‍යාපෘතිය නිම කළ යුතු කාලය සමඟ සැසඳීමේදී සියයට 60 ක ප්‍රගතියක් වාර්තා කළයුතු වුවත් එදිනට තත්‍ය භෞතික ප්‍රගතිය සියයට 23 කට ආසන්න ප්‍රමාණයක් බව විගණනයට ඉදිරිපත්කළ ලේඛන මගින් තහවුරු වූ අතර කලාප අංක 3,4,6 හි වැඩද ආරම්භ කර නොතිබුණි. එසේ වුවත් ව්‍යාපෘතියේ අසාමාන්‍ය කාල ප්‍රමාදයක් වලක්වා ගෙන නියමිත කාලයට ව්‍යාපෘතිය නිම කළ හැකි නව වැඩ පිළිවෙලක් කළමනාකරණය විසින් හඳුන්වාදී නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපෘතිය විසින් මාස 03 ත් 06 ත් වැනි කෙටි කාලයක් තුල වැඩ අවසන් කල යුතු කොන්ත්‍රාත් වැඩ 60 ක් පැකේජ වශයෙන් උපකොන්ත්‍රාත්කරුවන්ට ලබාදී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඔවුන්ට රු.337,080,517 ක සවලීකරණ (Mobilization) අත්තිකාරම් ලබා දී තිබුණි. මෙයින් ප්‍රමාද කාලය වසර ඉක්මවූ ශේෂයන්ද ඇතුලත්ව නොපියවූ අත්තිකාරම් ශේෂය රු.170,860,858 ක් විය. මේ අනුව ව්‍යාපෘතියේ ණය මුදල් යොදවා අත්තිකාරම් ලෙස කොන්ත්‍රාත්කරුවන්ට ලබාදුන් මුදල් අසාමාන්‍ය කාලයක් කොන්ත්‍රාත්කරුවන් අත රඳවා ගෙන තිබූ බව නිරීක්ෂණය විය.

(iii) ව්‍යාපෘතිය සඳහා ලබාගත් ණය මුදල්වලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.මිලියන 444 ක් අරමුණෙන් බැහැරව ප්‍රති මිලදී ගැණුම් ඇණවුම් (Repo) වල ආයෝජනය කර තිබුණි. එමෙන්ම මෙම ආයෝජන මත සමාලෝචිත වර්ෂයේදී ලද රු.මිලියන 25.32ක පොලී ආදායම ලබාගෙන ව්‍යාපෘතියේ ලැබීමක් ලෙස සටහන් නොකර සංස්ථාවේ පොලී ආදායමක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(iv) සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ලබාගත් රු.මිලියන 2,798 ක ණය මුදල වෙනුවෙන් ගෙවිය යුතු ණය පොලිය හා වාරික වටිනාකම වූ රු.මිලියන 726 .54 ක් ණය ගිවිසුම අනුව නියමිත දිනයන්හි ගෙවීමට සංස්ථාව අපොහොසත් වීම මත 2015 ජූලි 28 දින බැංකුව විසින් ණය මුදලේ ඉතිරි ශේෂය වන රු.මිලියන 11,429 ක ණය ලබාදීම අත්හිටුවා තිබුණි. ව්‍යාපෘතිය නිසි මූල්‍ය කළමනාකරණයකින් තොරව කටයුතු කිරීම මෙම තත්ත්වයට සෘජුව බලපා තිබුණි.

(v) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ණය මුදලේ ශේෂය වන රු.මිලියන 11,429 ක් මහා භාණ්ඩාගාරය මගින් ලබාදීමට හා ඉතිරි කිරීමේ බැංකුවෙන් ලබාගෙන තිබෙන රු.මිලියන 2,550 ක ණය මුදලේ වාරික හා පොලිය කොටස් වශයෙන් ගෙවීමට අවශ්‍ය මුදල් මහාභාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ ලබාගැනීම උදෙසා 2016 ජූලි 29 දින අංක 2016/සීපී/56 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කලද, උක්ත ව්‍යාපෘතියේ වියදම් දැරීමට ප්‍රතිපාදන ලබාදීමට හැකියාවක් නොමැති බවත් සංස්ථාවට වාර්ෂිකව ලබාදෙන අයවැය ප්‍රතිපාදන තුල ව්‍යාපෘති වියදම් කළමනාකරණය කර ගත යුතු බවටත් අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කර තිබුණි.

ඉහත කරුණු අනුව ව්‍යාපෘතිය ඉදිරියට ක්‍රියාත්මක කරන්නේ කෙසේද යන්න විගණනයේදී ප්‍රශ්ණකාරී වුවද සංස්ථාව විසින් ඒ වෙනුවෙන් ප්‍රමාණවත් අවධානයක් යොමු කර සංශෝධිත ක්‍රියාකාරී සැලසුම් පිළියෙල කර නොතිබුණි. එමෙන්ම ව්‍යාපෘතිය යටතේ වැඩ ආරම්භ කල කලාප තුල (Zone) ඇල මාර්ග අසල ජීවත්වන නිවාසලාභීන්, ව්‍යාපෘති කටයුතු වෙනුවෙන් තාවකාලිකව ඉවත් කර තිබුණද මෙම කරුණු මත ව්‍යාපෘතිය අපේක්ෂිත කාලය තුල ක්‍රියාත්මක නොකල හොත් විවිධ සමාජීය ගැටළු වලට සංස්ථාවට මුහුණ පෑමට සිදුවන බව වැඩි දුරටත් නිරීක්ෂණය විය.

(vi) ව්‍යාපෘති කටයුතු සඳහා අවශ්‍ය වන ඉඩම්, ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ පවරා ගැනීමට 2012 වර්ෂයේ සිට කටයුතු කලද සමාලෝචිත වර්ෂය අවසානයට එම ක්‍රියාවලිය ආරම්භ කර වර්ෂ 04 ක් ගතව තිබුණද ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධි විධාන පරිදි කිසිදු ඉඩමක් රජයට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර ඉඩම් පනත යටතේ ගැසට් කරන ලද ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 267.67 ක් විය. කෙසේ වුවද මූලික අධ්‍යනයක් සිදුකර ව්‍යාපෘතිය යටතේ පවරා ගත යුතු ඉඩම් ප්‍රමාණය කොපමණද යන්න හඳුනාගෙන නොතිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය අවසානයට ඉඩම් අත්පත්කර ගැනීමේ ප්‍රගතියද විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(vii) 2013 ජූලි 08 දිනැති අංක අමප/13/0781/503/065 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ව්‍යාපෘතිය මගින් බලපෑමට ලක්වන පුද්ගලයින්ගේ ගොඩනැගිලි හා වෙනත් නිර්මිතයන් වෙනුවෙන් තක්සේරු මුදලින් සියයට 80 ක් අත්තිකාරම් මුදල් ගෙවීමට ප්‍රථම එම පාර්ශවයන් සමග ගිවිසුම් වලට එළඹිය යුතු වුවද එලෙස ගිවිසුම් වලට එළඹීමකින් තොරව ගෙවන ලද අත්තිකාරම් මුදල රු.මිලියන 54.62 වූ අතර අත්තිකාරම් සීමාව ඉක්මවා මුළු තක්සේරු මුදල වන රු.මිලියන 18.88 ක් ඇතැම් පුද්ගලයින්ට ගෙවා තිබුණි.

එමෙන්ම බලපෑමට ලක්වන පුද්ගලයින්ට සහන දීමනා ගෙවීමේදී ඒ වෙනුවෙන් ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ නිරීක්ෂණ ලබාගත යුතු බවට අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබුණද එලෙස නිරීක්ෂණ ලබාගැනීමකින් තොරව සංස්ථාව විසින් රු.මිලියන 31.07 ක් ගෙවා තිබුණි.

(viii) දේපලවල අයිතිය තහවුරු කර ගැනීමේ කමිටුවේ නිර්දේශ ලබාගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය අවසානයට සංස්ථාව අනු පවුල් 12 ක් වෙනුවෙන් රු.මිලියන 3 ක් වන්දි වශයෙන් ගෙවා තිබුණි.

(ix) සංස්ථාව විසින් අමාත්‍ය මණ්ඩල තීරණයකින් තොරව හා රජයේ තක්සේරුකරුගෙන් වන්දි වාර්තාවක් ලබාගැනීමකින් තොරව ආරක්ෂක හේතූන් මත ඉවත්කරන ඉදිකිරීම් හා නිර්මිතයන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.මිලියන 35.52 ක් ගෙවා තිබුණි.

(x) ව්‍යාපෘතියේ රත්තනපිටිය කටු ඇල මාර්ගය සංවර්ධනය කිරීමේ වැඩ සටහනේදී රත්තනපිටිය පරණ කැස්බෑව පාරේ ව්‍යාපාරික ස්ථානයට පිවිසීමට ඇති පාලමක් කඩා ඉවත් කර, ඇල මාර්ගය සකස් කිරීමෙන් පසු නැවත එම පාලම ඉදිකර දීමට ව්‍යාපෘතිය විසින් සැලසුම්කර තිබුණද සංස්ථාව විසින් උක්ත පාලම වෙනුවෙන් රු.මිලියන 1.84 ක වන්දියක් ව්‍යාපාර හිමිකරුට ගෙවා තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂය සඳහා සංස්ථාව විසින් කුලී වාහන ලබාගැනීමේදී වර්ෂය ආරම්භයේ මිල ගණන් කැඳවා කුලී වාහන සැපයුම්කරුවන් හා කුලී වාහන මිල ගණන් තීරණය කර තිබූ අතර කුලී ගිවිසුම් අළුත් කිරීමේදී නැවත තරඟකාරී මිල කැඳවීමකින් තොරව කලින් තීරණය කල මිලටම කුලී වාහන ලබාගෙන තිබුණු අතර ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දරන ලද වියදම රු.මිලියන 4.84 ක් විය. තවද සංස්ථාව විසින් ගොඩනැගිලි ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහාද මෙම ක්‍රමවේදය යොදාගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 328.70 ක ගොඩනැගිලි ද්‍රව්‍ය මිලදීගෙන තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව රු.මිලියන 73.71 ක් වටිනා (බදු රහිත) Steel Sheet Piles මිලදී ගෙන තිබුණු අතර ඒ සම්බන්ධව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.7.5 වගන්තිය අනුව අමාත්‍යාංශ ලේකම් වරයා විසින් සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ මිලදී ගැනීම් වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවක් පිහිටුවා තිබුණද උක්ත මිලදී ගැනීම් කටයුතු වෙනත් කමිටුවක් මගින් සිදු කර තිබුණි.

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1 වගන්තියට පටහැනිව සංස්ථාවේ පර්යේෂණ හා සැලසුම් අංශයේ අංශ ප්‍රධානියා ප්‍රසම්පාදන කමිටුව නියෝජනය කර තිබූ අතර තාක්ෂණික ඇගයීම් කමිටුවට සංස්ථාවෙන් පරිබාහිර නියෝජිතයෙකුද සහභාගී වී නොතිබුණි.

(iii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.1 වගන්තිය අනුව දේශීය සැපයුම්කරුවන් සීමිත වන විට ජාත්‍යන්තර තරඟකාරී මිල කැඳවීම් ක්‍රමය (ICB) අනුගමනය කල යුතු වුවද උක්ත මිලදී ගැනීම වෙනුවෙන් සංස්ථාව ජාතික තරඟකාරී මිල කැඳවීම් ක්‍රමය (NCB) අනුගමනය කර තිබුණි.

(iv) එමෙන්ම මෙම මිලදී ගැනීම සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම තුල ඇතුලත්ව නොතිබුණු අතර Steel Sheet Piles මිලදී ගැනීමේ අවශ්‍යතාවය හා ඒවා යොදාගැනීමට අපේක්ෂිත ව්‍යාපෘති මොනවාද යන්න විගණනයට පැහැදිලි නොකෙරුණි. තවද සමාලෝචිත වර්ෂය අවසාන වනවිට මෙම ද්‍රව්‍ය භාවිතයෙන් තොරව ගබඩාවේ නිශ්ක්‍රීයව පැවතුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවේ ඉදිකිරීම් අංශය විසින් සිදුකරන ලද බාහිර කොන්ත්‍රාත් 03 ක වැඩ අත්හිටුවීමට සිදු වීම මත සංස්ථාව ලැබූ සමුච්චිත අලාභය රු.මිලියන 15.97ක් විය.

**4.8 වෙනත් ආයතන වෙත ලබාදුන් සංස්ථාවේ සම්පත්**

-----------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 ඡේදයේ නියමයන්ට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවේ කාර්ය මණ්ඩලයෙන් 04 දෙනෙකු වෙනත් රාජ්‍ය ආයතන වෙත මුදා හැර තිබූ අතර එම අයගේ වැටුප් හා දීමනා ලෙස සංස්ථාව විසින් රු.මිලියන 1.82 ක් වැයකර තිබුණි. එසේම සංස්ථාව සතු වාහනයක් රේඛීය අමාත්‍යාංශය වෙත නිදහස් කර තිබුණි.

(ආ) කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියෙන් එහි උප ව්‍යාපෘතියේ කටයුතු වෙනුවෙන් භාවිතයට ගැනීම සඳහා සංස්ථාවට ලබාදුන් කැබ් රථයක්, ඒ සඳහා භාවිතා නොකර ප්‍රධාන ව්‍යාපෘතියේ ධාවන කටයුතු වෙනුවෙන් ලබාදී තිබුණි.

## 4.9 කාර්ය මණ්ඩල පරිපාලනය

-------------------------------

පහත සඳහන් නිරීක්‍ෂණ කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ අනුමත කාර්ය මණ්ඩලය 1,872 ක් වූ අතර එදිනට තථ්‍ය කාර්යමණ්ඩලය 1,428 ක් විය. එක් එක් සේවා තනතුර අනුව සංස්ථාවේ කාර්යමණ්ඩලයේ 487 ක පුරප්පාඩු පැවති අතර අතිරික්ත කාර්ය මණ්ඩලය 43 ක් විය. එම පුරප්පාඩු අතර සංස්ථාවේ ප්‍රධාන තනතුරු වන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (විශේෂ ව්‍යාපෘති) හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සැලසුම් හා ව්‍යාපාර සංවර්ධන) තනතුරු පුරප්පාඩුව පැවතීම මෙම තත්ත්වය සංස්ථාවේ පහළ කාර්යසාධනයට බලපා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට සංස්ථාවේ පරිපාලිත සමාගම වන ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සමාගම මගින් වැටුප් ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත සංස්ථාවට බඳවාගත් කාර්ය මණ්ඩලය 58 ක් වූ අතර එම ප්‍රමාණය ඇතුලත්ව කාර්ය මණ්ඩලය සංශෝධනය කිරීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි.

## 4.10 හඳුනාගන්නා ලද පාඩු

---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාව විසින් ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ (පුද්ගලික) සමාගම වෙත බදු දී ඇති වර්ග අඩි 3186 ක ගොඩනැගිල්ල සඳහා 2005 වර්ෂයෙන් පසුව කුලී තක්සේරු නොකිරීම හේතුවෙන් සංස්ථාවට ලැබිය යුතු වර්තමාන කුලී ආදායම අහිමි වී තිබුණි.

(ආ) සංස්ථාව විසින් පවත්වාගෙන යන පස් පරීක්ෂණ ආයතනය මනා කළමනාකරණයකින් තොරව කටයුතු කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලැබූ අලාභය රු.මිලියන 5.21 ක් විය.

## 4.11 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිරිවැය රු. මිලියන 189.16 ක් වූ සෙමින් චලනය වන තොග ශේෂයක් විය.

(ආ) 2013 වර්ෂයේ සාලමුල්ල නිවාස ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව සඳහා මිලදී ගත් රු.මිලියන 10.36 ක් වටිනා එසවීමේ යන්ත්‍ර (Hoist) 02 ක් හා රු. මිලියන 40.32 ක් වටිනා පලංචි (Scaffolding props) හා ජී.අයි. බට 2014 වර්ෂයේ සිට භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවති අතර උපකරණ නිසි වැසි ආවරණයක් සහිතව ගබඩා නොකිරීම නිසා භාවිතයට ගත නොහැකි ආකාරයට දිරාපත් වෙමින් පැවතුණි.

(ඇ) දියත උයන පරිශ්‍රය සඳහා 2014 වර්ෂයේදී මිලදීගෙන තිබුණු රු.මිලියන 2.58 ක් වටිනා එළවළු තැටි 100 ක් භාවිතයට නොගෙන මිලදී ගත් දින සිට ගබඩාවේ දිරාපත්ව තිබුණි.

(ඇ) සංස්ථාව විසින් 2012 වර්ෂයේදී මිලදී ගත් පිරිවැය රු.මිලියන 2.09 ක් වන ලියවන මැෂිම සමාලෝචිත වර්ෂය අවසාන වන විට මිලදීගෙන වර්ෂ 04 කට වැඩි කාලයක් ගතව තිබුණද භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවති අතර ලියවන පට්ටල් වැඩ බාහිර ආයතන වලින් සිදුකර ගෙන තිබුණි.

(ඉ) සංස්ථාව විසින් 2014 වර්ෂයේදී බෙල්ලන්විල ආපන ශාලාව වෙනුවෙන් මිලදී ගත් පිරිවැය රු.මිලියන 1.46 ක් වූ මුළුතැන්ගෙයි උපකරණ භාවිතයට ගෙන නොතිබුණු අතර ඒවා තොග ලේඛනයේද ඇතුලත් කර නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

---

**5.1 සංයුක්ත සැලැස්ම**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 ඡේදය අනුව සංයුක්ත සැලැස්මට ඇතුලත් විය යුතු ආයතනයේ වර්තමානයේ පවතින සම්පත්, පසුගිය වසර තුනක මෙහෙයුම් ප්‍රතිඵල ප්‍රගතිය, යනාදී තොරතුරු ඇතුලත් කර සංයුක්ත සැලැස්ම සකස් කර නොතිබුණි.

(ආ) වටිනාකම රු.මිලියන 11,836 ක් වූ ව්‍යාපෘති සංයුක්ත සැලැස්ම තුල ඇතුලත් කළද ඒවා මොනවාද යන්න කළමනාකරණය විසින් නිශ්චිතව හඳුනාගෙන නොතිබුණි.

(ඇ) සංස්ථා පනත මඟින් පැවරී ඇති පහත සඳහන් කටයුතු ඉටුකිරීමට අදාල කාර්යයන් සංයුක්ත සැලැස්ම තුල ඇතුලත්ව නොතිබුණි.

(i) දිවයින පුරා පිහිටි පහත් වගුරු බිම්, නිසරු හෝ මඩ ඉඩම් හඳුනාගෙන අනවසර ඉඩම් ගොඩකිරීම පාලනය කිරීම හා අධීක්ෂණය කිරීමට හැකිවන පරිදි ගැසට් නිවේදන මඟින් ප්‍රසිද්ධ කිරීම.

(ii) ඇල ඉවුරක ඇති යම් ඉඩම් ප්‍රදේශයක්, ඇල රක්ෂිත ප්‍රදේශයක් ලෙස හඳුනාගෙන එම රක්ෂිත ප්‍රදේශය තුල තාවකාලික හෝ වෙනත් ඉදිකිරීම් වැළකෙන පරිදි ගැසට් නිවේදන මඟින් ප්‍රසිද්ධ කිරීම.

(ඈ) සංයුක්ත සැලැස්ම තුල හඳුනාගත් උපාය මාර්ග ලඟා කර ගැනීමට සංස්ථාව ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණු අතර හඳුන්වා දුන් ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPI) අනුව ප්‍රගතිය ඇගයීමට ලක්කර නොතිබුණි.

(ඉ) සංයුක්ත සැලැස්මෙහි සමාලෝචිත වර්ෂය සඳහා හඳුනාගත යුතු ව්‍යාපෘති වෙනුවෙන් රු. මිලියන 892 ක් වෙන්කර තිබුණු අතර එය මුළු ව්‍යාපෘති පිරිවැයෙන් සියයට 78 කි. එමෙන්ම සංයුක්ත සැලැස්මෙහි ඇතුලත් විවිධ ව්‍යාපෘතීන් සංස්ථා පනතට අදාල වන ආකාරය පිළිබඳව යොමුවක් දක්වා නොතිබුණි.

**5.2 අභ්‍යන්තර විගණනය**

---

කළමනාකරණය විසින් නිවැරදි කළ යුතු ක්ෂේත්‍ර සම්බන්ධයෙන් මඟ පෙන්වීම් සඳහා වැදගත් ක්‍රියාවලියක් ලෙස අභ්‍යන්තර විගණනය යොදා ගත යුතු වුවත් මහා පරිමාණ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවකු ලෙස සංස්ථාවේ කාර්යයන් පුළුල් වීමත් සමඟ අර්ථාන්විත ප්‍රතිඵල අත්කර ගැනීම සඳහා අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩලය බලගැන්වීමට සංස්ථාව විසින් නිසි අවධානයක් යොමු කර නොතිබුණි. තවද අභ්‍යන්තර විගණන වැඩසටහන් තුළ සංස්ථාවේ කාර්යසාධනය ඇගයීමට අදාල වැඩසටහන් අන්තර්ගතව නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (අභ්‍යන්තර විගණක) තනතුර පුරප්පාඩුව පැවතුණි.

## 5.3 ප්‍රසම්පාදන සැලැස්ම

-------------------------

සංස්ථාව විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය ප්‍රකාරව ඉදිරි වර්ෂ 03 කට අදාල (2016-2019) ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් ඇතුලත් වන පරිදි ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය වෙනුවෙන් විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර පිළියෙල කරන ලද සැලැස්ම තුලින් එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් (Individual Procurement Action) , ක්‍රියාකාරකමට අදාල ඇස්තමේන්තුගත වටිනාකම හා එම වටිනාකමට අදාලව පත්කල යුතු ප්‍රසම්පාදන කමිටුව කුමක්ද යන්න හා ප්‍රසම්පාදනයන්ට අදාල නිවැරදි කාල රාමුවක්ද නිරූපණය නොවුණි. තවද ප්‍රසම්පාදන සැලැස්ම මාස 06 කට වරක් යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි.

## 5.4 අයවැය ලේඛනමය පාලනය

---------------------------------

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම සහ වියදම තථ්‍ය ආදායම හා වියදම සමඟ සැසඳීමේදී සියයට 9 සිට සියයට 322 ක් දක්වා වූ පරාසයක ප්‍රමාණාත්මක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 5.5 නොවිසඳී ඇති විගණන ඡේද

---------------------------------

ඉකුත් විගණන වාර්තාවලින් පෙන්වා දෙන ලද පහත සඳහන් කරුණු සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නොවිසඳී පැවතුණි.

(අ) අදාල වගකිව යුතු පාර්ශවයන්ගෙන් අනුමැතිය ලබා ගැනීමෙන් තොරව කාර්ය මණ්ඩලය වෙත අඛණ්ඩව වෘත්තීය දීමනා ගෙවීම.

(ආ) නිලධාරින්ගෙන් වාහන ණය මත අයකරනු ලබන පොලිය අඛණ්ඩව නැවත ප්‍රතිපූර්ණය කර තිබීම.

(ඇ) සංස්ථාව විසින් රු.මිලියන 30.2 ක පිරිවැයක් දරා සංවර්ධනය කරන ලද අක්කර 3.5 ක් වූ ඉඩමක, ප්‍රාදේශීය ලේකම්ගේ සහයෝගය මත කෝවිලක් ඉදිකළ පාර්ශවයකට එරෙහි නීතිමය පියවර කඩිනමින් ගන්නා ලෙස 2012 නොවැම්බර් 30 දින පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් නියෝග කර තිබුණි. කෙසේ වෙතත් , අදාල නියෝගය ක්‍රියාත්මක කිරීම සඳහා සංස්ථාව විසින් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඈ) සේවක අර්ථ සාධක සහ සේවක භාරකාර අරමුදල වෙත ප්‍රේෂණය කළ යුතු දායක මුදල් ගණනය කිරීමේදී අදාල පනත් සහ චක්‍රලේඛ මගින් නියම කර ඇති දීමනා හා වෙනත් පාරිශ්‍රමික ගෙවීම් ගණනය කර නොතිබීම.

(ඉ) 1993 මාර්තු 31 දිනැති අංක අමප/93/340/041 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි කොළඹ 05, ඇල්විටිගල මාවතේ පිහිටි පර්චස් 3.05 ක ඉඩම් කොටස 1993 ජුනි 21 දිනැති අංක 73 දරන බදු ගිවිසුම මගින් 99 අවුරුදු බදු කාල සීමාවක් සඳහා පුද්ගලයෙකු වෙත බදුදී තිබුණු අතර ගිවිසුම අනුව ඉඩමේ වටිනාකම වශයෙන් රු. 152,000 ක්ද වාර්ෂිකව ගෙවිය යුතු රු.305 ක නාමික බදු මුදලක්ද සංස්ථාවට ලැබිය යුතු විය.

මේ සම්බන්ධව පහත සඳහන් කරුණු අනාවරණය විය.

(i) 2008 මාර්තු 28 දින මුල් බදු ගිවිසුම අවලංගු කර එදිනට ඉතිරි බදු කාලය වූ වසර 84 ක් වෙනුවෙන් නව බදු ගිවිසුමක් යටතේ දෙවන බදුකරුවකුට නැවත බදු දී තිබුණු අතර 2010 ජූනි 30 දින දෙවන බදුකරුද උප බදු ගැණුම්කරුවෙකුට 2013 වර්ෂයේදී දේපල බදු දී තිබුණි. උප බදු දීමේ ගිවිසුම්වලට එලඹීම මුල් බදු ගිවිසුමේ ප්‍රතිපාදන නොතිබියදී ඒ බව නොසලකා වසර 3 කට එම ඉඩමම නැවතත් වෙනත් පුද්ගලික සමාගමකට බදු දීම සඳහා දෙවන බදුකරු ඉල්ලීම මත සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව එකඟතාව ලබාදී තිබුණි.

(ii) එමෙන්ම උප බදු ලබාදෙන අවස්ථාවල එයට අදාල පරිපාලන ගාස්තු ගණනය කිරීමේදී සංස්ථාව විසින් ඉඩමේ බදු වටිනාකම සියයට 25 දක්වා අඩු කිරීම මත අයකරන ලද පරිපාලන ගාස්තුව ඉතා පහළ අගයක් ගෙන තිබුණු අතර වටිනාකම අඩු කිරීමට පාදක වූ කරුණු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(iii) 2008 මාර්තු 28 දින බදු ගිවිසුම අවලංගු කර එදිනට ඉතිරි බදු කාලය වන වසර 84 ක් වෙනුවෙන් නව බදු ගිවිසුමක් යටතේ පෞද්ගලික සමාගමකට නැවත බදු දී තිබුණි. අමාත්‍ය මණ්ඩල තීරණයක් මත එළඹි බදු ගිවිසුමක් අවලංගු කර අමාත්‍ය මණ්ඩල තීරණයකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත නව ගිවිසුමකට සංස්ථාව විසින් එළඹ තිබුණි. එමෙන්ම මුල් බදු ගිවිසුමේ (III) වගන්තිය අනුව 99 අවුරුදු බදු කාලයෙන් පසුව පමණක් බදුකරු හෝ උරුමකරුවන් වෙනුවෙන් බදු කාලය සංශෝධනය කල හැකි වුවත් එම වගන්තියද උල්ලංඝනය කර තිබීම.

(iv) මුල් ගිවිසුමෙන් වර්ෂ 15 කට පසු දෙවන බදු ගිවිසුමට එළඹෙන අවස්ථාවේදී ඉඩම නැවත තක්සේරු නොකර මුල් ගිවිසුමේ වටිනාකම පදනම් කරගෙන ගිවිසුම් ගතවී තිබීම නිසා සංස්ථාවට විශාල පාඩුවක් සිදුව තිබීම.

(ඊ) වෙරස්ගඟ වැසි ජලය අපවහන හා පරිසර වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ව්‍යාපෘතිය ආරම්භ කළ හා අවසාන කළයුතු කාලවකවානු තුල උක්ත ව්‍යාපෘතිය නිමකරන ආකාරය දැක්වෙන පරිදි කාල නිර්ණයන් ඇතුලත් ක්‍රියාකාරී සැලැස්මක් (Time Frame) හා ඇල මාර්ග, පාලම්, බෝක්කු, නඩත්තු මාර්ග, ජල රැඳවුම් ප්‍රදේශ ආදියට අදාලව, යෝජිත වැඩ ලැයිස්තුවක් (Work Schedule/Inventory) පිළියෙල කිරීමකින් තොරව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.

(ii) ව්‍යාපෘය මගින් අනාගතයේ ඇතිවිය හැකි ගංවතුර ආපදා තත්ත්වයන් හඳුනා ගැනීම, ඒවායේ අවම හා උපරිම ප්‍රමාණයන් කුමක්ද යන්න හා එමඟින් ඇතිවිය හැකි අවදානමේ තත්ත්වයන්ද හඳුනාගෙන නොතිබීම.

(iii) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී හඳුනාගෙන තිබූ කලාප (Zone) සහ උප ව්‍යාපෘති (Packages) වෙනුවෙන් පිළියෙල කළයුතු මාසික හා වාර්ෂික ප්‍රගති වාර්තා පිළියෙල කර නොතිබීම.

(iv) ව්‍යාපෘතියට අදාල කලාප අංක 1,2 සහ 3 හි ගේබියන් බැම් (Gabian Structure) සැකසීම සඳහා රු. 281,461,659 ක අධිඇස්තමේන්තු සකසා තිබුණු අතර ඒ මත කොන්ත්‍රාත්කරුවන්ට සවලිකරන අත්තිකාරම් වැඩිපුර ගෙවා තිබීම.

(v) සම්මත ප්‍රමිතීන්ට අනුව ගේබියන් බැම් බැඳීම සඳහා අඟල් 4 x 6 (100*150mm) කළු ගල් පමණක් භාවිතා කල යුතු වුවත් එම ප්‍රමාණයේ කළු ගල් භාවිතා කර තිබුණේ ඉදිකිරීම් වලින් සියයට 25 කටත් අඩු ප්‍රමාණයකින් බව ඒ පිළිබඳව සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය. ඉතිරි සියයට 75 කට වැඩි ප්‍රමාණය සඳහා අඟල් 12 x16 (200*400mm) කළුගල් භාවිතා කර තිබූ බව නිරීක්ෂණය විය. එමෙන්ම මෙම තත්ත්වය බ්‍රිතාන්‍ය ප්‍රමිත අංක BS 8002,1984 ට පටහැනි විය. මෙම ප්‍රමිතයට අනුව Gabian boxes වලට ගල් ඇතිරීමේදී භාවිතයට ගත හැකි කළු ගල් වල උපරිම ප්‍රමාණය 200mm වේ.මෙම තත්වය යටතේ Gabian boxes තුල එලෙස විශාල ගල් ඇතිරීම මඟින් ඒවාට හානි වීම සිදුවිය හැකි අතර සම්මත ප්‍රමිතීන්ට අනුව මෙම බැම් ඉදිකර නොතිබීම.

(vi) කලාප අංක I හි දිග මීටර් 2,889 ක කොටසක ඇළ මාර්ග සංවර්ධනයට අදාල වැඩ කොටස් උප ව්‍යාපෘති 34 කට කොටස් කර කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණු අතර එම කොටස් මීටර් 54, මීටර් 68, මීටර් 100 සහ මීටර් 110 ලෙස ඉතා කුඩා කොටස් වලට මුළු කොන්ත්‍රාත්තුව වෙන් කිරීමට හේතු වූ කරුණු විගණනයට පැහැදිලි නොකිරීම මෙන්ම මේ තත්ත්වය යටතේ දිග මීටර් 2,889 ක ඇල මාර්ගය සංවර්ධනයට පුවත්පත් දැන්වීම් භාෂා 3 කින් පලකිරීම වෙනුවෙන් විශාල පිරිවැයක් දැරීමට සිදුව තිබීම. එසේම මෙකී සෑම උපකොන්ත්‍රාත්තුවක් සඳහාම සනීපාරක්ෂක කටයුතු සඳහා වැසිකිළි ඉදිකිරීම, කාර්යාල ඉදිකිරීම, කාර්මික නිලධාරීන් වෙන් කිරීම් යනාදිය වෙනුවෙන් රු. මිලියනය ඉක්මවූ මූලික වියදම් (Preliminaries) ඇස්තමේන්තු කර ගෙවීමට කටයුතු කර තිබීම.

(උ) කොළොන්නාව , සාලමුල්ල නිවාස 216 ක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ (ඒ ගොඩනැගිල්ල) ඇස්තමේන්තු කොන්ත්‍රාත් වටිනාකම වූ රු. මිලියන 516.44 ක් ඉක්මවා රු.මිලියන 95.14 ක් වැයකර තිබීම.

**5.6 පාරිසරික හා සමාජ වගකීම් ඉටු කිරීම.**

---------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉහල පාරිසරික අවධානමක් සහිත වගුරු බිමක් ලෙස පරිසර අධිකාරිය විසින් නම් කල සංස්ථාවට අයත් මුතුරාජවෙල ස්වභාවික වගුරු බිම වෙත කොළඹ මහනගර සභාව විසින් දිනපතා එකතු කරන කසල ටොන් 700 ක් පමණ කිසිදු පාරිසරික හෝ ශක්‍යතා අධ්‍යනයකින් තොරව දිනපතා බැහැර කරන බව 2017 ජුනි 07 දින සිදු කල ස්ථානීය විගණන පරීක්ෂාවේදී අනාවරණය වුවද එය වැළැක්වීමට සංස්ථාව විසින් පියවර ගෙන නොතිබුණි. තවද මෙලෙස කසල බැහැර කිරීම හේතුවෙන් රක්ෂිතයේ ජලය හා වායුව දූෂණය වීම මත එහි ජීවත්වන ස්වභාවික සතුන්ගේ ජීවන පැවැත්මට මෙන්ම ස්වභාවික පරිසරයටද තර්ජනයක් වී ඇති බව වැඩි දුරටත් නිරීක්ෂණය විය.

(ආ) සංස්ථාව විසින් බස්නාහිර පළාත හැර ලංකාවේ පළාත් 4 ක පහත්, වගුරු, මුඩු හෝ ගොහොරු ඉඩම් වල මායිම් ගැසට් කර තිබුණද එම ඉඩම් ප්‍රදේශ වල අනවසර ගොඩකිරීම, අනවසර පදිංචිවීම් හඳුනාගැනීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණු අතර එම තත්ත්වයන් පරීක්ෂා කිරීම වෙනුවෙන් නිළධාරීන්ද අනුයුක්ත කර නොතිබුණි. මේ හේතුවෙන් අනාගතයේදී විවිධ සමාජයීය හා පාරිසරික ගැටළු වලට සංස්ථාවට සෘජුව මුහුණ දීමට සිදු නොවේ යැයි විගණනයේදී පිළිගත නොහැකි විය.

(ඇ) වේරස් ගඟ වැසි ජල අපවහන හා පරිසරය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කර වසර 04 කට අධික කාලයක් ගතව තිබුණද එහි ප්‍රගතිය ඉතා පහල මට්ටමක පැවතීම හේතුවෙන් ව්‍යාපෘතිය මගින් බලපෑමට ලක්වූ නිවාස ලාභීන්ගේ නිවාස නැවත තනාගැනීමට නොහැකිව වර්ෂ කිහිපයක සිට අසරණභාවයට පත්ව තිබුණි. එමෙන්ම ඇල මාර්ගයට මායිම් වුවද පවරානොගත් ඉඩම් කැබලි වල පිහිටි ඇතැම් නිවාස ඇල මාර්ගයේ සංවර්ධන කටයුතු හේතුවෙන් ගිලා බැස ඇති බව වැඩි දුරටත් නිරීක්ෂණය විය. නිසි සැලසුමකින් හා අධ්‍යනයකින් තොරව ඉඩම් අත්පත් කර ගැනීම, ඇල මාර්ග සංවර්ධනයට යල්පැන ගිය යන්ත්‍රෝපකරණ භාවිතය මත සිදුවන

කම්පනය (Vibration) මෙම තත්ත්වයට සෘජුව බලපා තිබුණි. එමෙන්ම මෙවැනි ස්ථානවල ඇල මාර්ග සංවර්ධන කටයුතු අත්හිටුවා තිබුණු අතර මෙම ගැටළු නිරාකරණයට අදාල විසඳුම් ලබාදීමටද සංස්ථාව අපොහොසත්ව තිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳ වරින්වර සංස්ථාවේ සභාපතිවරයා දැනුවත් කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) කොන්ත්‍රාත් පරිපාලනය | සැලසුම්ගත ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම, කොන්ත්‍රාත්වල ප්‍රගතිය පහල මට්ටමක පැවතීම හා ඉදිකිරීම් ප්‍රමිතීන්ට අනුගතව ඇතැම් ඉදිකිරීම් කර නොතිබීම. |
| (ආ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය | (i) තරඟකාරිත්වයක් ඇතිවන පරිදි මිල කැඳවීමකින් තොරව කලින් තීරණය කරන ලද මිල ගණන් මත ප්‍රසම්පාදන කටයුතු කර තිබීම. |
| | (ii) ඉඩම්වල වර්තමාන තක්සේරු වටිනාකම ගණනය කිරීමකින් තොරව ඇතැම් ඉඩම් කල් බදු පදනම මත ලබා දීම. |
| (ඇ) මූල්‍ය කළමනාකරණය | (i) අත්තිකාරම් මුදල් අදාල කාර්යය නිමවූ විගසම හා සංවර්ධනකරුවන්ගෙන් ලබාගත් තැන්පත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබීම, ණය ගිවිසුම් ප්‍රකාරව ණය වාරික හා පොළී කාලීනව පියවීමට කටයුතු කර නොතිබීම. |
| | (ii) ගිවිසුම් ප්‍රකාරව බදු කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබීම. |
| | (iii) විවිධ වැඩසටහන් සඳහා ලැබුණු රාජ්‍ය ප්‍රදාන අරමුණට පරිබාහිර කටයුතු සඳහා භාවිතා කර තිබීම. |
| (ඈ) ගිණුම්කරණය | (i) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති බොහොමයකට අනුගත නොවී මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබීම. |
| | (ii) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි වත්කම් හා වගකීම් විෂයයන් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත නොකිරීම හේතුවෙන් ඒවායේ වටිනාකම අධි හා ඌන ගණනය වී තිබීම. |